සන්නස
SANNASA



# සමස්ථ වික්ටෝරියාවේ හොඳම සම්මානය විජිතට

## VACC සම්මානයෙන් පුද ලද නොදර්න් ෆ්ලීට්කෙයා අධිපති විජිත දෙල්ගම සමග සංවාදයක්

**ව්‍යාපාරිකයන් ලෙස සාර්ථකත්වයට පත් ශ්‍රී ලාංකිකයන් ඔස්ට්‍රේලියාවේ හිඟ නැත. තමන්ගේ හැකියාවෙන් හා දක්ෂතාවෙන් නිසි ප්‍රයෝජන ගනිමින් සමාජයට රැකියා අවස්ථා බිහි කරමින් ඔවුන් කරගෙන යන්නාවූ ව්‍යාපාර එක් අතකින් සමාජ සේවාවක්ද වෙයි. මේ සියලු ව්‍යාපාරිකයන් අතරින් අතළොස්සක් තම ව්‍යාපාරයෙන් බැහැරව විවිධාකාර වූ සමාජ සේවා හා එක්වෙමින් තමා ජීවත්වන සමාජයට සුවිශේෂී සේවාවක් කරන බව අපට පෙනී යයි. ඔවුන් තමන් උපයන මුදලින් ඒ සමාජ සේවා නඩත්තු කරගෙන යන්නටත් ඒවා වැඩි දියුණු කරන්නටත් වෙහෙසෙන ආකාරය දැකීමත් ආශ්වාදයකි. එවන් වූ අතළොස්සක් වන ව්‍යාපාරිකයන් අතරින් එක් අයකු සමස්ථ වික්ටෝරියාවේ සම්මානයට පාත්‍රවනු දැකීමේ භාග්‍යය අපට හිමිවී ඇත. මේ දක්ෂ ව්‍යාපාරිකයා ක්‍රේගිබර්න් හි නොදර්න් ෆ්ලීට් කෙයා ආයතනය බිහිකර එය සාර්ථකත්වය දක්වා මෙහෙයවමින් සිටින විජිත දෙල්ගම මහතා ය.**

සිය ව්‍යාපාරයටම කොටුවී නොසිට විවිධ සමාජසේවා කටයුතු මගින් සිය සමාජ මෙහෙවර නොපිරිහෙලා ඉටු කරන විජිත පිලිබඳ කතා කරන්නට බොහෝ දේ අප හමුවේ තබා ඇති ශ්‍රී ලංකිකයෙකි. විවිධ සමිති සමාගම් වලටද වික්ටෝරියා පොලිසියේ විවිධ ක්‍රියාකාරකම් වලටද හවුල්වී ඇති විජිත කරේගිබර්න් සූරිය උදානය අලුත් අවුරුදු උළෙල ආරම්භ කරන්නටත් පවත්වාගෙන යන්නටත් දුන් සහය අති විශිෂ්ටය. සමහර විටෙක ඔහුගේ දායකත්වය නොලැබෙන්නට මේ උත්සවය මේ තත්වයට පත් නොවන්නට ඉඩ තිබුණ බවද බොහෝ අය පවසති.

විජිත ගේ සමාජ කටයුතු දැක ගත හැකි වන්නේ සමාජ සංවිධාන අතර පමණක් නොවේ. ඉතා නිහඬව කිසිවකුට නොදැනෙන සේ ඔහු අත හිත දුන් කලා කටයුතු අපමණය. මෙල්බන් ලේඛකයන්ගේ පොත පත ප්‍රකාශයට පත් කරන්නට පමණක් නොව විවිධ සන්දර්ශන සඳහාද ඔහු දුන් දායකත්ව දන්නෝ විරළ ය.

සමාජයට මේ සා දායකත්වයක් දෙන විජිත දෙල්ගම පසුගිය දා වික්ටෝරියාවේ ඔටෝමොබයිල් චේම්බර් ඔෆ් කොමර්ස් ඒක්ක ආයතනයේ සම්මානයට පාත්‍ර වීම සමස්ථ ශ්‍රී ලාංකික ප්‍රජාවටම සතුටු විය හැකි කාරණයකි. බර වාහන සහ සැහැල්ලු වාහන නඩත්තු කිරීමේ සහ අලුත්වැඩියාවේ නමක් ගත් විජිතගේ නොදර්න් ෆ්ලීට් කෙයා ආයතනය එම ක්ෂෙත්‍රයේ හොඳම කුඩා ව්‍යාපාරික ආයතනය ලෙස තෝරා ගැනෙන්නේ ඒ සම්මානය සඳහා තරග කළ පන්දහසක් පමණ වන අනෙකුත් සියලුම ආයතන පරදවමිනි.

මේ සම්මානය ලබා ගැනීමෙන් පසු සන්නස විජිත දෙල්ගම මහතා සමග කළ කතාබහකි මේ.

**මේ සම්මානය සඳහා තෝරා ගැනීමේදී වීඒසීසී ආයතනය අනුගමනය කළ ක්‍රමවේදය ගැන යමක් කියන්න පුලුවන්ද?**

ඔව්.. ඒක දිග ක්‍රියාවලියක්. ඔවුන් අපේ ආයතනයට පැමිණ වරින්වර එය පරීක්සා කළා. ඔවුන් සමග සම්මුඛ සාකච්ඡා කරන්න සිදුවුණා. ඒ සාකච්චා වලදි ඔවුන් ඇසූ විවිධාකාර ප්‍රශ්න වලට සාර්ථකව පිළිතුරු දෙන්න අපට සිදුවුණා. අනෙක් අතින් ව්‍යාපාරික ආයතනයක් හැටියට අපේ ආයතනයෙන් සමාජයට ලපබා දෙන දේ පිළිබඳව පවා ඔවුන් ප්‍රශ්න කළා. මේ දීර්ඝ ක්‍රියාවලියෙන් පසු තමයි ඔවුන් අපේ ආයතනය මේ ක්ෂෙත්‍රයේ හොද්ම ආයතනය ලෙස තෝරා ගන්නෙ. ඒහෙම තෝරා ගත්තා වුණත් ඔවුන් ඒක අපට කල්තියා දැනුම් දුන්නෙ නැහැ. අදාල සම්මාන ප්‍රදාන උත්සවදේ තමයි මම දැනගත්තෙ අපි පළමු තැනට පත්වෙලා ඉන්න බව. ඒ වෙලාවෙ මට දැනුණෙ විශ්මයක් වගේම මං ආව දුෂ්කර ගමන පිලිබඳ ආඩම්බරයක් මුසු සතුටක්.



**නෝදර්න් ෆ්ලීට් කෙයා වැනි ආයතනයක් ආරම්භ කරන්නට මුල් වුණ පසුබිම කොහොමද?**

මම අධ්‍යාපනය ලැබුවෙ ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ. එහි පාඨමාලාව සම්පූර්ණ කර අවුරුද්දක් යන්න කලින් මං ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වුණා. මේ ක්ෂෙත්‍රයෙම විවිධ රැකියා කීපයක් කළාට පසුව මට හිතුණා මගේම කියා ආයතනයක් ආරම්භ කරන්න. මේක විශාල අභියෝගයක්. තනි පුද්ගලයෙක් හැටියට මං ගත්ත විශාල අවදානමක්. ඒත් මගේ දැනුම ගැන විශාල විශ්වාසයක් තිබුණා. ඒ නිසා මම බය නැතුව මගේ මේ වාහන නඩත්තු ආයතන ආරම්භ කළා. මගේ අවධානය වැඩියෙන්ම යොමු වුණේ බර වාහන නඩත්තුව ගැන. මොකද බර වාහන නඩත්තු කරන්න හැකියාව තිබෙන නඩත්තු ආයතන ඉතාම අඩුවෙන් තිබුණ කාලයක් ඒක. ඒනිසා මං බර වාහන වලට වැඩි ඉඩක් ලැබෙන හැටියට මේ ආයතනය ආරම්භ කළා. නමුත් මං සියලුම වර්ගවල බර සහ සැහැල්ලු වාහන වලට එක ලෙස මේ ආයතනයේ දී සේවා සපයනවා.

මුලින්ම 2001 වසරේ කැම්බෆීල්ඩ් හි කුඩා තැනක ආරම්භ කළ මගේ ආයනය පසුව ක්‍රේගිබර්න් හි 10 ගැසොලින් වේ හි දැන් මේ තියෙන වඩා ඉඩ කඩ ඇති තැනට ගෙන ආවා. ඒ ආවායින් පසුව වඩා වැඩි වාහන ප්‍රමාණයකට එකවර සේවා සපයන්න මට හැකි වුණා පමණක් නෙවෙයි වැඩි රැකියා අවස්ථා ප්‍රමාණයක් නිර්මාණය කරන්නටත් හැකිවුණා.

**මෙවන් සම්මානයක් ලැබුණට පස්සෙ විජිතට මොකද දැන් හිතෙන්නෙ?**

මට හිතෙන හැටියට මේ සම්මානයත් එක්කම අපේ වගකීම තවත් වැඩිවුණා. දැන් අපට සිදුවෙනවා අපේ සම්මානයට ගැළපෙන ලෙස අපේ ආයතනයේ තත්වය තව තවත් දියුණු කරන්න. වැඩි වැඩියෙන් නව තාක්ෂණයට යොමුවෙන්න. ආයතනයේ පහසුකම් තවත් වැඩි කරන්න. සේවා තත්වය තව තවත් ඉහළ නංවන්න. මේ සියල්ල අතරේ අපේ සමාජ වගකීම් දෙස තවත් අවධානය යොමු කරන්න. මම විහ්වාස කරනවා නියම ව්‍යාපාරයක් නම් සැම විටම සමාජය සමග සිටිය යුතුය කියන කාරණය. ඕනෑම වයාපාරයක් හැමවිටම තමන්ගෙ සමාජ වගකීම ගැනත් හිතන්න ඕනෙ. ඉතින් මේ සම්මානයත් සමගම අපි තව තවත් ඉදිරියටම යන්න ඕනෙ කියන විහ්වාසය දැන් මගේ හිතේ තියෙනවා.

**විජිත ලංකාවේ ගතකළ ජීවිතය ගැනත් පොඩ්ඩක් කතාකරමුද?**

ඔව්. මම මුළින්ම අධ්‍යාපනය ලැබුවේ කිරිඳිවැල මහා විද්‍යාලයේ. ඉන්පස්සෙ කොළඹ තර්ස්ටන් විද්‍යාලයේ. තර්ස්ටන් විද්‍යාලයේ අධ්‍යාපනයෙන් පසුව තමයි මම ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ වේරහැර පුහුණු ආයතනයට ඇතුල්වුණේ. මොකද මට කුඩා කාලයේ සිටම ආශාවක් තිබුණා කාර්මික ක්ෂෙත්‍රයට. ඒ ගැන හොඳ දැනුමක් ලබාගන්න ලංකාවෙ තියෙන හොඳම ආයතනයට ඒ නිසා තමමි මම ඇතුල්වුණේ.

**ඔබේ පවුලේ අයගෙන් ලැබෙන සහයෝගය කොහොමද?**

මම විශේෂයෙන් කියන්න ඕනෙ මගේ බිරිඳ ගැන. මේ දුෂ්කර ගමනෙදි මගේ බිරිඳ මට විශාල සහයෝගයක් දුන්නා. අදත් ඇය මගේ ආයතනයට පැමිණ එහි විවිධ කටයුතු සඳහා මට සහයෝගය දෙනවා. ඒ වගේම මගේ දූ දරුවන් තුන්දෙනාත් මට මේ ගමන යන්න විශාල ශක්තියක්. ඒ අතින් මම ඉතාම වාසනාවන්තයි.

**ඔබේ ආයතනයෙන් සිදුවන සමාජ සේවා ගැන යමක් කතා කරමුද?**

ඒ ගැන කතා කරන්න මම විශේෂයෙන්ම කැමතියි. මොකද විවිධ සමාජසේවා කටයුතු වල යෙදීමෙන් මම විශාල සතුටක් ලබන නිසා. අපි වික්ටෝරියාවේ පොලිසියට, ගිනි නිවන හමුදාවට, රෝහල් වලට, විවිධ ක්‍රීඩා සංගම් වලට විවිධාකාර ආධාර ලබා දී තියෙනවා. විශේෂයෙන්ම ක්‍රේගිබර්න්හි සූරිය උදානය සිංහල සහ දෙමළ අලුත් අවුරුදු උත්සවය සංවිධානය කිරීමේ පුරෝගාමී කටයුතු වල සම්බන්ධ වුණා විතරක් නෙවෙයි එය ඉදිරියට ගෙනයන්නටත් දායක වුණා. ඒ ඇරෙන්න මගේ ශක්ති පමණින් විවිධ කලා කටයුතු වලටත් සහයෝගය දීලා තියෙනවා. ඒ අදාල සංවිධාන සහ අදාල අය දන්නවා අපි දුන්න දායකත්වය ගැන. මගේ අරමුණ අපේ සමාජය සමග අත්වැල් බැඳගෙන ඉදිරියට යන එක.

**මේ ගමන එන්නට ඔබට සහය දුන් අය ඇති?**

නම් වශයෙන් සඳහන් කරන්න බැරි තරම් පිරිසක් මට සහය දීලා තියෙනවා. ඒ අයට මගේ ස්තුතිය පුද කරන්න කැමතියි. ඒ වගේම මගේ ආයතනයේ සේවයේ යෙදී ඉන්න මගේ සහෝදර සහෝදරියන්ගෙන් මට ලැබන සහයෝගය ගැනත් සඳහන් කරන්නම ඕනෙ. මේ සම්මානය අපට ලැබෙන්න ඔවුන්ගේ කැපවීම විශාල ලෙස බලපෑවා කියන්න පුලුවන්. ඒ අයටත් මගේ ස්තුතිය පුදකරන්න මම මේ අවස්ථාව යොදා ගන්න කැමතියි.

**මේ සම්මානය සමගින් අපේ ශ්‍රී ලාංකික සමාජයට විජිත දෙන පණිවුඩය මොකක්ද?**

මට කියන්න තියෙන පළමු දේ තමයි තමන්ගෙ දැණුම ප්‍රයෝජනයට ගන්න කියන එක. තමන්ගෙ දැනුමින් ඉස්සරහටම යන්න කියන එක. බොහොම බාධක එනවාමයි. ඒත් ඒ කිසිවකින් සැළෙන්න එපා. තමන් පටන්ගත්ත ගමන ඉදිරියටම යන්න.

ජයග්‍රහණය කරන්න දවසක් එනවාමයි. අන් ඒ දවස එනතෙක් තමන්ගෙ ආත්මශක්තිය නොබිඳ පවත්වාගෙන යන්න. මගේ දීර්ඝකාලීන අත්දැකීම් එක්ක මම අපේ සමාජයට දෙන පණිවුඩය තමයි ඒක.



සංවාද සටහන
ජගත් ජේ එදිරිසිංහ